පාර්ලිමේන්තු මාලා අංක-487

ආයතනයේ නම: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

<u>பாராளுமன்ற தொடர் இலக்கம் - 487</u>

நிறுவனத்தின் பெயர் : சமுர்த்தி அபிவிருத்தி திணைக்களம் பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

PARLIAMENTARY SERIES NO -487

Name of the institution: Department of Samurdhi Development

Submission of observation of Hon.Minster and steps taken with regard to the Reports tabled by the Committee on public Accounts in terms of standing Order No.119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක-487

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
01	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමේදී අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ ගැටළු පැවතීම.	ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය,උඩරට සංවර්ධන අධිකාරිය,සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හා උඩරට ගැමි පුනරුත්තාපන දෙපාර්තමේන්තුව යන ආයතන ඒකාබද්ධ කර 2014.01.03 දින සිට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. එහි දී මෙම අධිකාරී තුනෙහි සේවය කළ නිලධාරීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පහත පරිදි අන්තර්ග්‍රහණය විය. ➢ නව සේවා ➢ මුල් සේවා ➢ සේවක අර්ථ සාධක අරමුදල් යටතේ කැමැත්ත පල කළ මේ අය අතුරින් මේ වන විට විශ්‍රාම ගිය සංඛ්‍යාව-5601 කි. මොවුන් අතුරින් 47 දෙනෙකු විසින් නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකිරීම මත විශ්‍රාම වැටුප් ගෙවීමට නොහැකිව ඇත. 2026.05.31 දිනට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු මුළු සංඛ්‍යාව 5554 කි.ඒ අතුරින් ගොණු 4704 ක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉහත දිනය වන විට තවත් ගොණු 140 ක් යොමු කිරීමට ඉතිරිව පවතින අතර එම කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. එයට අමතරව විවිධ අඩුපාඩු මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුල සැකසෙමින් පවතින ගොණු 710 කි. ඒ අනුව 2026.05.31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ විශ්‍රාම ගොනු සංඛ්‍යාව 4704 කි. 2025.05.31 දින වන විට විශ්‍රාම වැටුප් ගෙවා ඇති සංඛ්‍යාව 3769 කි. 2025.03.31 දිනෙන් පසුව තවත් පිරිසකට විශ්‍රාම වැටුප් ගෙවීම් කර ඇතත් ඒ සම්බන්ධ තොරතුරු අන්තර්ජාලය මඟින් ලබා ගැනීමේ හැකියාව නොමැති නිසා යාවත්කාලීන තොරතුරු අප සතුව නැත. මේ වන විට දිස්ත්‍රික් මට්ටමින් එම

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
		තොරතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. මෙයට අමතරව විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රමාද වීම අවම කර ගැනීම සඳහා පහත පරිදි කටයුතු ආරම්භ කර ඇත. 01.අඩු සුදුසුකම් සහිත අවු 55 න් ඔබ්බට සේවය කළ අය අවු 55 න් විශ්‍රාම ගැන්වීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම. 02.තවදුරටත් අදාල ගෙවීම් නොකිරීම මත විශ්‍රාම වැටුප අහිමි වී ඇති නිලධාරීන් වෙත 2026.09.15 දිනට පෙර එම ගෙවීම් කරන ලෙස ලිපි මඟින් දැනුම් දීම. 03.විනයානුකූල හේතූන් මත විශ්‍රාම වැටුප් ගෙවීම නවතා ඇති නිලධාරීන්ගේ ගොනු එක් එක් පුද්ගලයා වශයෙන් ගෙන්වා ගෙන එකී ගැටළු නිරාකරණය කර විශ්‍රාම වැටුප් ගෙවිය යුතු නිලධාරීන් වෙත 2026.10.31 දින වන විට විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය පියවර ගැනීම. 04.1995 දී හා ඉන් අනතුරුව බඳවා ගෙන ඇති සමහර නිලධාරීන්ගේ සේවය මේ වන විටත් ස්ථීර කර නැත.මෙකී නිලධාරීන්ගේ සේවය ස්ථීර කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිඵල සනාථ කර ගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ වාර්තා සටහන් පුද්ගලික ලිපි ගොනු සම්පූර්ණ කර විශ්‍රාම වැටුප් ගෙවිය හැකි නිළධාරීන් සඳහා 2026.12.31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කිරීම. 05.දීර්ඝ කාලයක් තිස්සේ පවතින ගැටළු නිරාකරණය කිරීම සඳහා ඉදිරියේ දී පළාත් මට්ටමින් ජංගම සේවයක් පැවැත්වීමට නියමිතය.

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වක්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
02	අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කිරීම.	i. 1996 සමෘද්ධි අධිකාරිය පිහිටුවීමෙන් අනතුරුව මෙම දෙපාර්තමේන්තුව සඳහා 2014.11.19 දින අනුමත කරන ලද කාර්ය මණ්ඩලය නැවත 2016.09.15 දින සංශෝධනය කර අනුමත කළ අතර, එම කාර්ය මණ්ඩලය නැවත 2019.07.05 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් යලිත් සංශෝධනය කරන ලදී. පසුව කරන ලද ඉල්ලීම් සලකා බලා 2023.11.01 දිනැතිව 25732 ක කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදී. මේ වන විට අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වී අස්වැසුම ප්‍රතිලාභීන් වෙත අදාළ සහනාධාර මුදල් සෘජුව ලබා දීමත් සමඟ දෙපාර්තමේන්තුවේ කාර්යභාරයේ අඩුවීමක් සිදු වී තිබේ. වර්තමානය වන විට දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වනුයේ අස්වැසුම පවුල් සවිබල ගන්වා ඔවුන් ඵලදායී ආර්ථික ක්‍රියාවලියක් වෙත යොමු කිරීමයි. එකී කාර්ය සඳහා පිහිටුවා ඇති සමෘද්ධි බැංකු පද්ධතිය ද මීට අදාළ වේ. මේ නිසා වර්තමාන කාර්යභාරයට ගැලපෙන ලෙස දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමාලෝචනය කර, නව කාර්ය මණ්ඩලයක් සකස් කිරීම සඳහා 2026.05.23 දිනැති ලිපිය මඟින් විශ්‍රාමලත් අමාත්‍යාංශ ලේකම්වරු දෙදෙනකු, විශ්‍රාමික ප්‍රධාන මුල්‍ය නිලධාරීවරයෙකු හා දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි යන අයගෙන් සමන්විත කමිටුවක් මේ වන විට පත් කර ඇති අතර, එකී වාර්තාව ලැබුණු පසුව නව කාර්ය මණ්ඩලයක් අලුතින් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ. ii. 2023.11.01දිනැතිව අනුමත කරන ලද කාර්ය මණ්ඩල තුළ බැංකු හා බැංකු සමිති සඳහා සමෘද්ධි කළමනාකරු, සමෘද්ධි සංවර්ධන නිලධාරි, කළමනාකරණ සහකාර තනතුරු අනුමත කර ඇති නමුත් විශ්‍රාම වැටුප් සහිත සේවකයන් බැංකු වෙත බඳවා ගැනීමට පනතේ 25 (3) වගන්තිය අනුව නොහැකි වන නමුත් නීතිපතිතුමා හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ඉදිරියේ දී බැංකු සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට මහා සංගමයට හැකි අතර ඉහත කමිටුවේ නිර්දේශ පරිදි ඊට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය. iii. මෙකී ඉහත යෝජනා ක්‍රියාත්මක වන තුරු දැනට අනුමත කාර්ය මණ්ඩලය තුළ අවශ්‍ය පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය පටිපාටි සකස් කර අදාළ අනුමැතීන් ලබා ගැනීමට යොමු කර ඇති අතර, එම අනුමැතීන් ලබා ගැනීමෙන් පසු මෙම වසර තුළ එකී බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වක්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
03	සමෘද්ධි බැංකු පරිගණකගත කිරීමේ වැඩපිළිවෙල	සමෘද්ධි බැංකු පරිගණකගත කිරීමේ වැඩපිළිවෙළට අදාලව මෘදුකාංග පද්ධති 02ක් ක්‍රියාත්මක වේ. එනම් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් බැංකු771 ක් ද හා සොෆ්ට්වොච්((soft watch) ආයතනය මගින් බැංකු 326 ක් ද ක්‍රියාත්මක කරයි. නමුත් මෙම මෘදුකාංග 02 මගින් ආවරණය වන බැංකු ප්‍රමාණය සමස්ත ක්‍රියාවලියෙන් 25%ක ප්‍රමාණයකි. එබැවින් 2025.07.23 දිනැති බැංකු කළමනාකරණ මණ්ඩල තීරණය පරිදි මෙම මෘදුකාංග දෙකෙහි පවතින අඩු පාඩු මග හරවා ගනිමින් සමස්ත බැංකු පද්ධතියම ආවරණය වන ලෙස නව මෘදුකාංගයක් සකස් කිරීමට තීරණය කර ඇත.(ඇමුණුම්-01) ඒ අනුව සුදුසුකම් ලත් විශේෂඥයකු මෙම කාර්ය කාර්යක්ෂමව ඉටුකර ගැනීම පිණිස මේ වන විට තෝරා ගෙන ඇති අතර මේ වන විට එම කාර්ය ඉදිරියට ගෙන යමින් පවතී.
04	පරිගණක 340 ක් ප්‍රසම්පාදනය කිරීමේදී සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට රුපියල් මිලියන 11 ක පමණ පාඩුවක් සිදු වී තිබීම(සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2022-154(6) වාර්තාව 3.4 ඡේදය)	අංක රා.ගි.කා.ස/9/4/2024 හා2024.01.12.දිනැති ලිපියේ පරිදි රජයේ ගිණුම් කාරක සභාව විසින් ලබා දුන් නියෝග සහ නිර්දේශ අංක 04 යටතේ පරිගණක 340ක් ප්‍රසම්පාදනය කිරීමේ දී සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට රුපියල් මිලියන 11 ක පමණ පාඩුවක් සිදු වී තිබීම යන කරුණ යටතේ සකස් කරන ලද වාර්තාවේ දෘඩ පිටපත(සිංහල) කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම් ගේ අංක MSE/ACC/01/44/11 වෙළුම හා 2024.02.09 දිනැති ලිපියෙන් රජයේ ගිණුම් කාරක සභාව වෙත යොමු කර ඇත.(ඇමුණුම-03)

අනු අංක	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු / වත්මන් තත්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග
05	ජීවනෝපාය සඳහා සමෘද්ධිලාභීන් වෙත මාලු දැල් ලබාදීමේ දී "දමන"ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ මූල්‍ය අක්‍රමිකතාවයන් සිදු වී ඇති බවට වාර්තා වීම සම්බන්ධයෙන් විනය ක්‍රියා මාර්ග ගැනීම	කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MSE/ACC/01/44/1 වෙළුම හා 2024.08.20 දිනැති ලිපියෙන් එම අමාත්‍යාංශය මට්ටමින් මෙම සිදු වීම පිළිබඳ පවත්වන ලද මූලික විමර්ශනයේ වාර්තාව අනුව සිද්ධියට අදාළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 11 කාණ්ඩයේ පළමු උපලේඛනගතව චෝදනා පත්‍ර නිකුත් කිරීමට තරම් ප්‍රමාණවත් හේතු නිරීක්ෂණය නොවන බවත් එම නිලධාරීන් කෙරෙහි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවරයන් සම්බන්ධයෙන් සෑහීමටකට පත්විය හැකි බවත් වාර්තා කර ඇත.
06	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අරමුදල් විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් නොවීම.	දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍රමූල්‍ය අංශය විසින් අධිකාරී සමයේ විවිධ අවශ්‍යතාවයන් වෙනුවෙන් වෙන් වෙන්ව බැංකු ජංගම ගිණුම් ආරම්භ කොට මේ වන තෙක් පවත්වාගෙන යනු ලබන ගිණුම් අනුව පවතින අරමුදල් මේ යටතට අයත් වේ. මෙම අරමුදල් සම්බන්ධව කටයුතු කිරීම සඳහා 2026.03.30 දින පැවති දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී නම් කරන ලද විශේෂඥ කමිටුව වෙත ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කරනු ඇත.(ඇමුණුම්-04) 2025 අංක 15 දරණ සමෘද්ධි(සංශෝධිත) පනත මගින් සමෘද්ධි බැංකු ජාතික විගණන කාර්යාලයේ විගණනයට යටත් වන බැවින් විගණකාධිපතිවරයාගේ විගණනයට මෙම ගිණුම් යටත් වන බව වාර්තා කරමි.

<table>
<tr><th>අනු අංක</th><th>කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු</th><th>අඩුපාඩු / වත්මන් තක්ත්වය නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග</th></tr>
<tr><td>07</td><td>“අස්වැසුම” වැඩසටහනට අයත් නොවන සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම.</td><td><u>අස්වැසුම වැඩ සටහනට අයත් නොවන සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම</u>
මීට අදාලව 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ සටහන් ඇතුලත් සැලැස්මේ සාරාංශය පහතින් ඉදිරිපත් කර ඇත.
<table>
<tr><th>අනු අංක</th><th>වැඩ සටහන</th><th>ප්‍රතිපාදන වෙන් කිරීම(රු.මිලි)</th><th>භෞතික ඉලක්කය</th></tr>
<tr><td>01</td><td>සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩ සටහන</td><td>346.00</td><td>පවුල්4,275</td></tr>
<tr><td>02</td><td>ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩ සටහන</td><td>25000.00</td><td>ණය 100,000</td></tr>
<tr><td>03</td><td>සිප්දොර ශිෂ්‍යත්ව වැඩ සටහන</td><td>554.00</td><td>ශිෂ්‍යත්ව30,500</td></tr>
<tr><td></td><td>එකතුව</td><td>25900.00</td><td></td></tr>
</table>
</td></tr>
</table>

ධම්මික මුතුගල
අධ්‍යක්ෂ ජනරාල්
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

සම්පත් මන්ත්‍රීනායක
ලේකම්,
ග්‍රාමීය සංවර්ධන,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

සම්පත් මන්ත්‍රීනායක
ලේකම්
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ
ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
01වන මහල, අදියර II, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

	ගැනීමේදී නිදහසකු ගෙන රු.8,036ක් වැඩිපුර අයකර ගෙනු ඇති බව නිරීක්ෂණය විය.					
08	කැන්පතු පොදු තැන්පත් ගිණුමේ කාල විශ්ලේෂණ වාර්තා අනුව 2024 වර්ෂයේදී අදාලව ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වල තැන්පත් වර්ග 04ක් පවත්වාගෙන යන අතර එයට අදාල නිරවුල් නොකළ තැන් පත් ශේෂය රු.2,387,236,132 කි. අවු 1-2 අතර ශේෂය රු.2,033,468 අවු 2-5 අතර ශේෂය රු.3,912 අවු 5 ට වැඩි ශේෂය රු.2,375,752,987	තෙන්මාරච්චි පිඟිරි ගොඩනැගිල්ල ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට පැවරීමට අදාලව ගිවිසුම් ප්‍රකාරව ලැබී ඇති මුදල් පොදු තැන්පතු ගිණුමට තැන්පත් කරන ලෙසත්, එක් කර ඇති කමිටුවේ තීරණය අනුව කටයුතු කර ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදි.	ගිවිසුමට අනුව පොදු තැන්පත් ගිණුමට ගෙන ඇත.කමිටුවේ තීරණය අනුව රජයේ අදායමට බැර කර ඇත.	ප්‍රගතිය ඉදිරි කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි.	ප්‍රගණ කාධිකා රී හා අනු කමිටුව	07
	2019/2020 හා 2021 වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුලත් කරුණු					
09.	2018/12/31 දක්වා වූ වංචා 107 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු හා විනය කටයුතු ප්‍රමාද වීම.	කවදුරටත් ඉතිරිව ඇති විනය කටයුතු 05 හි ප්‍රගතිය ලබා දෙන ලෙසත්, සමස්ථ විමර්ශන 452 ස්වභාවය අනුව වර්ග කර ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදි.	2018.12.31 දක්වා වූ වංචා 107න් 2026.01.31 දිනට ඉතිරි සිද්ධීන් 04 හි ප්‍රගතිය ඉදිරිපත් කර ඇත. 2026.01.31 දිනට පවතින විනය ගොනු ස්වභාවය අනුව වර්ග කරන ලද සාරාංශ වාර්තාව ප්‍රගතිය ඉදිරිපත් කර ඇත. ඒ වන් විට පැවති විනය ගොනු 452 න් විනය ගොනු 13ක් අවසන් කර ඇති අතර; 2026.01.31 දින වන විට පවතින විනය ගොනු සංඛ්‍යාව 439කි.	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ මූලික විමර්ශන නිලධාරී සංචිතයෙන් නිලධාරීන් ලබා ගැනීම හා දෙපාර්තමේන්තු මූලික විමර්ශන නිලධාරී සංචිතයක් සැකසීම මගින් විමර්ශන ක්‍රියාවලිය කඩිනම් කිරීමට තීරණය විය. කාල නිර්ණය අනුව විමර්ෂණයන්හි වර්ගීකරණයක් හා ප්‍රගතිය ඉදිරි කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.	අධ්‍යක්ෂ විමර්ශන	2
10.	ISW/A/SDO/23/AO/2023/08 හා 2023.12.07 දිනැති බැංකු මූල්‍ය අංශය සතු අරමුදල් හා	ලිපිද්‍රව්‍ය වක්‍රීය අරමුදල අදාල ක්‍රියාමාර්ග ගෙන වසා දැමීමට කටයුතු කරන ලෙසත්, ඉතිරි අරමුදල් 05	ක්ෂුද්‍ර මූල්‍ය අංශය සතුව අනිවාර්ය ඉතිරි කිරීම් මුදල් හා ලිපිද්‍රව්‍ය වක්‍රීය අරමුදල් ගිණුම් පමණක් පවත්වාගෙන යන ලබන	අරමුදල් හා ආයෝජන කටයුතු සම්බන්ධව විධිමත් අධ්‍යනයක් සිදු කර වාර්තාවක් ලබා ගැනීමට තීරණය විය.මෙම කමිටුව	අධ/ ක්ෂු.මූ ල්‍ය	07

...ම අරමුදල් ...යෝජන ...සිලිබඳ විගණන ...ම්සුම	පවත්වාගෙන යාමේදී ඒම අරමුදල් විගණනය කළහැකි පරිදි ව්‍යවස්ථානුකූල හා ක්‍රමවත් කරන ලෙසත් එහි ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදී.	අතර චක්‍රීය ලිපිද්‍රව්‍ය අරමුදලක් වශයෙන් පවත්වාගෙන ගිය ලිපිද්‍රව්‍ය අරමුදල "ක්ෂුද්‍රදැයි ප්‍රකාශිත බැංකු ලිපිද්‍රව්‍ය ගිණුම" වශයෙන් වෙනස් කිරීම සම්බන්ධව බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල රැස්වීමට 2025/143/06 මාණ්ඩලික පත්‍රිකාව 2025.12.11 දින ඉදිරිපත් කර ඇත. 2026.01.05 දින ප්‍රධාන මූල්‍ය නිලධාරී ප්‍රධානත්වයෙන් අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) සහභාගිත්වයෙන් පවත්වන ලද රැස්වීමෙදී සාකච්ඡා වූ අතර, ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල් නාමය සංශෝධනය කිරීම පිළිබඳ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට දැනුම් දීමට ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින් එකඟතාවය පල කරන ලදී.	පත් කිරීමේ වගකීම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) වෙත පවරන ලදී. 1.සභාපති-විශ්‍රාමික රා.ප. ලේකම් ප්‍රියන්ත මායාදුන්න මයා. 2.විශ්‍රාමික ලේකම් රුවන් වන්ද්‍ර මයා. 3.විශ්‍රාමික ප්‍රධාන ගණකාධිකාරී එස්.එල්.හෙට්ටිආරච්චි මයා. 4.අමාත්‍යාංශ අතිරේක ලේකම් ගාමිණි වීජේසිංහ මයා. 5.සම්බන්ධීකරණ නිති අධ්‍යක්ෂ සුසන්ත විජේසේකර මයා. මැයි 31 දින කමිටු පත් කිරීමේ හා ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය වාර්තා කිරීමට දන්වන ලදී.		

...ද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ...ගණාධිපති සම්පිණ්ඩන වාර්තාව.

...සම්.වාර්තාව-...3.12.31 ...ඔක්තෝබර් ...නැති වත්කම් ...මනා කරණ ...ල්ඛ ...020/02(අ). ...රණයට සුදුසු ...යේ පවතින ...කම් රු. ...,000ක්වූ ...3ක් දීර්ඝ ...ක් කිස්සේ ...ක	ජනවාරි මුල් සතිය තුල කාර්තු 02 වම අදාල කාර්තු වාර්තා ලබා ඉදිරිපත් කරන ලෙසත්, ප්‍රධාන කාර්යාලයේ ඉකිරි මෝටර් සයිකල් 02 හා දිස්ත්‍රික් කාර්යාලවල වාහන අපහරණ ය සිදු කර අවසන් කරන ලෙසත්, 2026 වාහන අපහරණය 2026.03.31 වන විට අවසන් කරන ලෙසත්, ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදී.	තුන්වන හා හතරවන කාර්තුවලට අදාලව වාහන පිරිවැය කාර්තු වාර්තා විගණනයට ඉදිරිපත් කර ඇත. 2026 අපහරණය ක්‍රියාවලියේදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 හි විධිවිධාන පරිදි හදුනාගැනීමේ කමිටු වාර්තා ලබා දී ඇති අතර ,වාහන තක්සේරු කමිටුව පත්කර ඇත.	යාවත්කාලීන වාහන රෙජිස්ත්‍රීකරයක් සැකසීමට තීරණය විය. අපහරණය කලයුතු වාහන හදුනා ගැනීමට කමිටුවක් පත් කිරීමටත් එම කමිටුව පත් කිරීමේ වගකීම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් පාලන වෙත පවරන ලදී. 1.සභාපති- ප්‍රධාන මූල්‍ය නිලධාරී 2.ඉංජිනේරු 3.අධ්‍යක්ෂ (පාලන)	අති.අ.ජ (පාලන) අධ/ පාලන	06

නොමැති බවත් ප්‍රකාශ කරන ලදි.

10. සමෘද්ධි බැංකු පද්ධතියට වඩාත් සුදුසු මෘදුකාංග පද්ධතියක් (Core Banking System), සුදුසු ජාල පද්ධතියක් (Network) හා ප්‍රමිතිගත උපකරණ පද්ධතියක් (Infra-Structure) තිබිය යුතු බවද සාකච්ඡා විය.

11. බැංකු කාර්ය මණ්ඩලය u tube, facebook වැනි සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම්වලට යොමු වීම නිසා මෘදුකාංග පද්ධතියේ මන්දගාමී බවක් ඇතිවන බවද ~~watch~~ SLTS ආයතනය දන්වා ඇති බවද සාකච්ඡා විය.

12. SLTS ආයතනයට අදාල පරිගණක මෘදුකාංග පද්ධතියෙන් කාලානුරූපීව ගිණුම්වලට පොළී ගණනයේදී සමහර අවස්ථාවලදී සම්පූර්ණයෙන් පද්ධතියේ බිඳ වැටීම සිදුවන බවත් සාකච්ඡා විය.

ඉහත කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව කළමනාකරණ මණ්ඩලය දැනුම් දුන්නේ මෙම මෘදුකාංග දෙකෙහිම ක්‍රියාකාරකම් ඉතා දැඩි අවදානම් සහගත තත්ත්වයක ඇති බවයි. ඒ සඳහා ඉතා කඩිනමින් අවශ්‍ය පියවර ගතයුතු බවද දැන්විය. මේ සඳහා සෘජුව වගකියන පුද්ගලයෙකු හා ඒකකයක් ස්ථාපිත කල යුතු බව ද දැන්විය. එසේම, ආපදා ප්‍රතිස්ථාපනය (Disaster Recovery) හා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති ඇතුළත් ලේඛනයක අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. සමෘද්ධි බැංකු පද්ධතියට ඉතා සුදුසු මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දිය යුතු බවද දැන්විය. දැනට පරිගණක මෘදුකාංග සේවා සපයන ආයතන දෙක කෙරෙහි කළමනාකරණ මණ්ඩලයට සැකීමකට පත්විය නොහැකි බවද දැන්විය.

විශේෂයෙන් මෘදුකාංග පද්ධතියේ තොරතුරු ඉල්ලා සිටින විට ඉල්ලා සිටින පාර්ශවයේ ආකෘතිය අනුව තොරතුරු නොලැබෙන බවට පැහැදිලි වන බැවින්, මේ පිළිබඳව විශ්වාසයක් තබා ඉදිරියට යා නොහැකි බව කළමනාකරණ මණ්ඩලය දැන්විය. එසේම සේවා ගිවිසුම් දිරිස කිරීමේදී ආයතනය ඉල්ලා සිටින ආකෘතිය අනුව, දත්ත ලබාදීමට එකඟ වන ආකාරයේ කොන්දේසි සහිතව ගිවිසුම අවසන් කිරීම පිළිබඳව මාස 03කට පෙර අදාල ආඥාපන වෙත දැනුම් දී සිදුකල හැකි බවටත් කොන්දේසි හා ගිවිසුම් කාලය දිගස කිරීම වැනි කාරණද ගිවිසුමට ඇතුළත් කල යුතු බව දැන්විය.

ඉදිරි ගිවිසුම්වලට එළඹීමේදී මේ සඳහා පවතින ප්‍රමිතිගත ආකෘති අනුව ගිවිසුම් ගත යුතු බවත්, ඒ සඳහා අවශ්‍ය සහය කළමනාකරණ මණ්ඩල සාමාජික කේ.වී.කුගනාදන් මහතා ලබාදෙන බවත් දැක්විය. එසේම කේ.වී.කුගනාදන් මහතා ප්‍රකාශ කළේ දැනටමත් අතිවිශාල පිරිවැයක් පවතින පරිගණක මෘදුකාංග පද්ධති දෙකට වැයවන බැවින්, අඩු පිරිවැයක් යටතේ ඉතා සුදුසු බැංකු පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා–දීමේ හැකියාව ඇති බවද දැනුම් දුනි.

		කෙසේ නමුත් එක්වර දැනට පවතින ක්‍රමවේදය වෙනස් කල නොහැකි හෙයින් ගිවිසුම් කාලය අවසන් දිනසිට ඉදිරි වසරක් සඳහා දැනට පවතින ආයතන දෙක සමඟ නව සේවා ගිවිසුම් ගතවීම කර, එම ඉදිරි කාලය තුල නව බැංකු මෘදුකාංග පද්ධතියකට යොමු වීමේ ප්‍රසම්පාදන කාර්යය ඉටුකර ගත යුතු බවට කළමනාකරණ මණ්ඩලයේ එකඟතාවය හා අනුමැතිය ලබාදුනි.

ටී.මහේෂ් ප්‍රනාන්දු
අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)

26/05/04 1-Y-02

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

අභිලාෂ ප්‍රකාශ කිරීම් සඳහා වන ඇරයුම (EOI)

පැවරුම් ශීර්ෂය : තනි පුද්ගල උපදේශකයින් බඳවා ගැනීම

යොමු අංකය : DSD/HO/18/Pr/05/08/2025

මූලික බැංකු පද්ධති ක්‍රියාත්මක කිරීම (Core Banking System Implementation) සඳහා උපදේශකයින්ගෙන් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. උපදේශන සේවාවන් සඳහා පහත සඳහන් තනතුර සඳහා මාස දෙළහක (12) කාලසීමාවකට තනි පුද්ගල උපදේශකයෙකු බඳවා ගැනීම ඇතුලත් වේ.

තනතුර	තනතුරු සංඛ්‍යාව	කොන්ත්‍රාත් අංකය
මූලික බැංකු පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා වන උපදේශක	(තනතුරු 01)	DSD/HO/18/Pr/05/08/2025

පැවරුම සඳහාවන සවිස්තරාත්මක සේවා නියමයන් (TOR) පහත වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය : http://www.samurdhi.gov.lk

සුදුසුකම් :

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) පිළිබඳ උපාධියක්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පිළිගනු ලබන ඒ හා සමාන විෂයයන් පිළිබඳ උපාධියක් හෝ පරිගණක විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් සමග මූලික බැංකු (Core Banking) ක්ෂේත්‍රයේ වසර 5 ක පළපුරුද්ද.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අවම වසර 03 ක පළපුරුද්ද.
- RFP (Request for Proposal) සහ ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම පිළිබඳ ඔප්පු කරන ලද විශේෂඥතාව.
- පිළිගත් බැංකුවල මූලික බැංකු ව්‍යාපෘති පිළිබඳ පූර්ව පළපුරුද්ද.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සේවාවන් සැපයීම සඳහා සිය අභිලාෂය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලත් "උපදේශන සේවා සපයන්නන්" වෙත දැන් ඇරයුම් කරනු ලැබේ. උකන්දුවක් දක්වන උපදේශකයින් විසින් සේවාව ඉටු කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහ අදාළ පළපුරුද්ද තමන් සතු බව පෙන්නුම් කරන පැතිකඩක් (Profile) සහ අයවැය යෝජනා (Budget Proposals) ඉදිරිපත් කළ යුතුය. කෙටි ලැයිස්තුගත කිරීමේ නිර්මාණයක වනුයේ : **අධ්‍යාපනික සුදුසුකම්, සේවා පළපුරුද්දු සහ සමාන ආකාරයේ ව්‍යාපෘති සඳහා වැඩි බරිතේ පූර්ව පළපුරුද්දු සහ සිදු කරන ලද සර්ශේෂණ ප්‍රකාශන වේ.**

අභිලාෂ ප්‍රකාශ කිරීම් ලිඛිතව පහත ලිපිනයේ පිහිටි පරිපාලන අංශයේ ටෙන්ඩර් පෙට්ටියට හෝ adsamurdhi2014@gmail.com යන විද්‍යුත් තැපෑලට 2026.05.18 දින පස්වරු 2.00 ට පෙර එවීමට කටයුතු කළ යුතුය.

සකාසන්,
දෙපාර්තමේන්තු උපදේශකයින්ගේ ප්‍රසම්පාදන කමිටුව,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,
4 වන මහල, 01 වන අදියර,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.
දුරකථන : 0112873795 / 0112873996 (විමසීම් සඳහා)

දැ.මු අ-03

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය
எனது இல.
My No : MSE/ACC/1/
11 වැනි

ඔබේ අංකය
உமது இல.
Your No :

දිනය
திகதி
Date : 2024.02.07

ලේකම්
රජයේ ඇස්මාර්ත් සිලිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුලත් කරුණු සහ 2023.04.25, 2023.05.26 හා 2023.08.09 යන දිනයන්හි පැවති රජයේ ඇස්මාර්ත් සිලිබඳ කාරක සභා විසින් ලබා දුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක රා.ගි.කා.ස/9/4/2024 හා 2024.01.12 දිනැති ලිඛිත පරිදි රජයේ ඇස්මාර්ත් කාරක සභාව විසින් ලබා දුන් නියෝග සහ නිර්දේශ අංක 04 යටතේ පරිගණක 340 ක් ප්‍රසම්පාදනය කිරීමේදී සමෘද්ධි සමාජ සංවර්ධන නිලධාරී මෙලුදලට රුපියල් මිලියන 11 ක පමණ පාඩුවක් සිදු වී නිසි ලෙස කරුණු සටහන් සකස් කරන ලද වාර්තාවේ ඇඩ පිටපත (සිංහල - 03) මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

යමුනා පෙරේරා
ලේකම්

පිටපත - විගණකාධිපති - කරු.දැ.ග.ස හා අ.කා.ස 01/2

ලේකම්/Secretary
කාර්යාල අලුවාසෙවක්/Office
ෆැක්ස්/தொலைநகல்/Fax
විද්‍යුත් තැපෑල/E-mail
වෙබ් අඩවිය/இணையத்தளம்/Website

සංඛ්‍යා, ළමා සවිබලගැන්වීම
011-2186057
011-2186055
011-2187249
secretary@childwomenmin.gov.lk
www.childwomenmin.gov.lk
5 වන මහල, ශ්‍රීජයවර්ධනපුර නැගෙනහිර II, බත්තරමුල්ල
5th Floor, Sri Jayawardenapura East II, Battaramulla

011 2869125
011-2887344-51
011-2187007
www.childwomenmin.gov.lk

DSD/HO/05/MF
2025.08. 20

එස්.ඒ.ජී.එස්. කුමාරි මිය,
සමෘද්ධි කළමණාකරු
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

2025.07.23 දින පැවති කළමනාකරණ මණ්ඩල තීරණ දැනුම් දීම.

2025.07.23 දින පැවති කළමනාකරණ මණ්ඩල තීරණ පහත පරිදි වේ. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

පත්‍රිකා අංකය	විෂය	ගනු ලැබූ තීරණය
2025/138/01	සමෘද්ධි ප්‍රජා මූල බැංකු මෘදුකාංග පද්ධතිය සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සර්විසස් ආයතනය හා සොෆ්ට් වොච් ඉන්ෆොසිස් ආයතනය සමග අත්සන් කළ සේවා ගිවිසුම් කාලය අවසන් වීම සම්බන්ධව ගතයුතු ක්‍රියා මාර්ග සඳහා උපදෙස් ලබා ගැනීම.	2025/138/01 මාණ්ඩලික පත්‍රිකාව, සමෘද්ධි බැංකු පද්ධතියට අදාල පරිගණක මෘදුකාංගයට සේවා සපයන ආයතන දෙකේ ගිවිසුම් කාලය අවසන් වීම සම්බන්ධ උපදෙස් පතා ඉදිරිපත් කල මාණ්ඩලික පත්‍රිකාවකි. කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි මෙදින රැස්වීම සඳහා සමෘද්ධි බැංකු පද්ධතියේ පරිගණක කටයුතු පිළිබඳව උපදේශන කටයුතු සඳහා පත්කල ආචාර්ය එස්.සී.ප්‍රේමරත්න මහතා විසින් මෙම පරිගණක පද්ධතියේ වර්තමාන තත්ත්වය කළමනාකරණ මණ්ඩලයට පැහැදිලි කරන ලදි. එසේම ඒ පිළිබඳව වාර්තාවක් ලිඛිතව කළමනාකරණ මණ්ඩලයට ලබා දී තිබිණි. ඒ අනුව ආචාර්ය එස්.සී.ප්‍රේමරත්න මහතා විසින් වාර්තාවේ අඩංගු කරුණු සංක්ෂිප්තව කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදි. 01. 2024 මාර්තු 31 දිනට UAT (User Acceptance Testing) නිම කිරීමට අදාල පාර්ශවයන් දෙකම එකඟ වී තිබුණත්, 2025 අප්‍රේල් 23 නිම කරන බවට වාචිකව සමාගම් දෙකම් ඒකඟතාවය ඵලකර ඇත. ඒ සඳහා ලබා දී තිබූ කාලය 2025.05.07 දිනෙන් අවසන් වී ඇති බවද දැනුම් දුනි. මේ පිළිබඳ වර්තමාන තත්වය ඇමුණුම් 01 සහ ඇමුණුම් 02 මඟින් දක්වා ඇති බව පැහැදිලි කරන ලදි. 02. සොෆ්ට්වොච් ආයතනය හා දැනට එම සමාගම් හා ඒකාබද්ධව කටයුතු කරන ඉන්දියානු සමාගම වන Ciphermint solutions India පුද්ගලික සමාගම හා එක්ව අත්සන් කරනු ලැබූ ගිවිසුම ඉදිරිපත් කිරීම දිගින් දිගටම ප්‍රමාද කර ඇති බව දැනුම් දුනි. එසේම එම සමාගම නව ආයතනයක් සමඟ ඇතිකරගත් නිල ගිවිසුම මේ දක්වා ඉදිරිපත් කර නොමැති බවද කළමනාකරණ මණ්ඩලය දැනුවත් කරනු ලැබිය. ඊට අදාල තොරතුරු ඇමුණුම 3 - 6 දක්වා ඇති ලේඛන මඟින් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් ඔවුන් පිළිගත් ගුණාත්මක ප්‍රමිතියට අනුකූල මෘදුකාංගයක් [illegible] අනාවාදයකට අදාල ISO යහතිකයක් ලබා දී

03. Disaster Recovery (DR) පරීක්ෂණ පාර්ශවයන දෙකම ඉටුකර තිබුණත් දත්තවල පවතින අඩුපාඩුකම් සහ විෂය පථයේ පවතින අඩුපාඩු දක්නට තිබූ බව කළමනාකරණ මණ්ඩලය දැනුවත් කරන ලදි. ඒ අනුව ප්‍රමිතිගත ආකෘතියක් සමාගම් දෙක වෙත යොමුකර ඇති බවත්, එම ආකෘතිය අනුව යාවත්කාලීන තොරතුරු බලාපොරොත්තු වන බවත් පැවසීය. DR අභ්‍යාස වාර්තා ඇමුණුම 7 සහ 8 වශයෙන් ඉදිරිපත් කර ඇත.

04. මේ දක්වා VPN පරීක්ෂණ ආරම්භ කර නොමැති බවත්, ශ්‍රී ලංකා ටෙලිකොම් වෙතින් යෝජනා ඉදිරිපත් කරන තුරු බලාපොරොත්තුව සිටින බවත් දැන්වීය. මෙම VPN පරීක්ෂණය ඉතා කඩිනමින් කල යුතු බවත් ඒ අනුව දත්ත ආරක්ෂාව තහවුරු කර ගැනීම, ස්ථාවර දුරස්ථ යොමුවක් පිළිබඳව අවබෝධයක් ලබාගැනීම කල හැක්කේ මේ මඟින් බවත් පැහැදිලි කරන ලදි.

05. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සර්වර් පහසුකම් ලබා ගන්නා බවත්, එහි සේවා ගිවිසුම දීර්ඝ කිරීම අදාලව ගිවිසුම පරීක්ෂා කිරීමේදී ගිවිසුමෙහි පොරොන්දු වූ ආකාරයටම සේවා ලබා දී නොමැති බවත්, ලබා දී ඇති සේවාවන් හා ගිවිසුම් යන සේවාවන් අතර පිරිවැය වෙනස්කම් පවතින බවත් පැවසීය.

06.තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ ලේඛනයක් මේ දක්වා සකස් වී නොමැති බවද එවැනි ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කිරීම තුළින් ප්‍රමිතිගත ක්‍රමවේද, ආරක්ෂිත ධූරාවලිය සහ තොරතුරු තාක්ෂණ පසුතල පහසුකම් පිළිබඳව මනා අවබෝධයක් ලැබෙන බවත්, එතුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහතික කරන බවද පැහැදිලි කරන ලදි.

07. එසේම සමෘද්ධි දෙපාර්තමේන්තුව තුල මේ පිළිබඳ සෘජුවම වගකියන තොරතුරු තාක්ෂණ ඒකක ත් දක්වා පිහිටුවා නොමැති බවත්, පද්ධතිය ගෙන යාමේ අඛණ්ඩ සහය, අධීක්ෂණය සහ ආරක්ෂා සඳහා මධ්‍යගත වගකියනු ලබන තොරතුරු තාක්ෂණ කණ්ඩායමක් සිටීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතු බවද දැනුම් දුනි.

08. SLTS ආයතනය පළමු වරට මෙවැනි බැංකු ක්‍රමයක පරිගණක මෘදුකාංගයක් සකස් කලත්, Soft wate ආයතනයට පෙර අත්දැකීම් ඇති බවද පැහැදිලි කර ලදි. එසේම සමෘද්ධි බැංකුවල අනුමැතියකින් තොර පරිගණක මෘදුකාංග පද්ධතියේ වෙනස්කම් සිදුකර බවද පැහැදිලි කරන ලදි. මෙම මෘදුකාංගපද්ධතියේ අයිතිය පිළිබඳව ප්‍රශ්න සහගත බවද පැහැදිලි කරන ලදි.

<u>පරිගණක 340ක් ප්‍රසම්පාදනය කිරීමේදී සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට රුපියල් මිලියන 11 ක පාඩුවක් සිදු වී තිබීම.</u>

2024 පෙබරවාරි 05 වන දින DSD/HO/03/Acc/24/2024/COPA අංක දරණ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයන් සඳහා දිගුවක් ලෙස පහත නිරීක්ෂන ඉදිරිපත් කරමි.

සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර අරමුදලේ මාණ්ඩලික පත්‍රිකා අංක 2018/SSSF/07/06 හා 2018.10.08 අනුව සමෘද්ධි සමාජ ආරක්ෂණ විෂයයට අදාලව රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට i3 computers 331 ක් ලබා ගැනීමට ඉදිරිපත් කල පත්‍රිකාව සඳහා අනුමැතිය ලබා දී ඇත.(ඇමුණුම 01)

ප්‍රධාන ගණකාධිකාරී විසින් ප්‍රධාන කාර්යාලයේ අවශ්‍යතාවයද සැලකිල්ලට ගෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් වැය කිරීමට 2020.08.14 වන දින පහත පරිදි අමතර මිලදී ගැනීම් සඳහා අධ්‍යක්ෂ ජනරාල් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.

අයිතමය	සමාජ ආරක්ෂණ අංශයේ අවශ්‍යතාවය	මිලදී ගැනීමට අපේක්ෂිත ප්‍රමාණය	අමතරව මිලදී ගන්නා ප්‍රමාණය
i5 Computers	331	340	09
UPS 650VA	331	340	09
Laser Printer	333	340	07
USB Flash Drive	333	340	07

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් i5 9th Generation වශයෙන් සඳහන්, අනුමත කල ලංසු ලේඛණ පදනම් කරගෙන 2020.09.17 දින ජාතික පුවත්පත් 03ක් මඟින් භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රසම්පාදන දැන්වීම පළ කර ඇත.

මිල ගණන් ඉදිරිපත් කිරීමට 2020 ඔක්තෝබර් 16 දින ප.ව 1.30 දක්වා අවස්ථාව ලබා දී ඇත.2020 ඔක්තෝබර් 16 වන දින ප.ව 2.00 ට මිල ගණන් විවෘත කර ඇත.(ඇමුණුම 02)

විවෘත කරන ලද ලංසු ලේඛණ, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති වෙත 2020 ඔක්තෝබර් 19 දින භාර දී ඇත.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති "Thakral One (Pvt) Ltd" ආයතනයේ එක් පරිගණකයක් රු.116,450.00 කට මිලදී ගැනීමට නිර්දේශ කර ඇත.මෙයට අමතරව "ඇමුණුම 05" වශයෙන් දේශීය සැපයුම් කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දීම (මුදල් අමාත්‍යාංශයේ 3/2020 හා 2020.10.09 චක්‍රලේඛය) කෙරෙහි අවධානය යොමු කර ඇත.(ඇමුණුම 03)

තාක්ෂණික ඇගයීම් කමිටුව ලබා දුන් නිර්දේශ අනුව ප්‍රසම්පාදන කමිටුව විසින් මේ සම්බන්ධව බෙදුනු තීරණයක් ලබා දී ඇත.එක් සාමාජිකයෙක් විසින් "ප්‍රසම්පාදන ලියවිලි වල ඇතුලත් කරුණක් පසුව ප්‍රසම්පාදන ලියවිලි ඇගයීමේදී සලකා බැලිය හැකිද යන්න විමසා බැලීම සුදුසු යැයි යෝජනා කරමි".යනුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණයේ සඳහන් කර ඇති අතර අනෙකුත් සාමාජිකයන් ඉදිරිදනා තාක්ෂණික කමිටුව විසින් නිර්දේශ කර ඇති

පරිදි ඩෙස්ක්ටොප් පරිගණක 340 ක් එකක් රු.119,250.00 බැගින් මිළදී ගැනීම පිණිස E W INFORMATION Systems Limited ආයතනය වෙත ඇනවුම පිරිනැමීමටත් ඒ සඳහා එම ආයතනයට රු.40,545,000 ක මුදලක් ගෙවීමටත් එකඟතාවය ලබා දී ඇත.(ඇමුණුම 04)

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14:1 ට අනුව මෙම ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට එවකට සිටි ලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර ලේකම් විසින් "පවත්නා කත්තව්‍ය මත මෙය නැවත ටෙන්ඩර් කැඳවීම් හෝ නැවත සලකා බැලීම් සුදුසුය".යනුවෙන් සඳහන් කර ඇත.පසුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ හා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය මත නැවත මිල ගණන් කැඳවීමට ලේකම් විසින් අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව i5 10th Generation ලෙස සංශෝධනය කරන ලද ලංසු ලේඛණ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර, 2021 පෙබරවාරි මස 22 දින ජාතික පුවත්පත් 03ක භාෂා තුනෙන්ම ප්‍රසම්පාදන දැන්වීම් පළ කර ඇත. අනතුරුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මුදල් අමාත්‍යාංශයේ 03/2020 හා 2020.10.09 දිනැති චක්‍රලේඛයට අනුව අදාල ආයතනය සමඟ සාකච්ඡාවක් පවත්වා මිල ගණන් අඩු කරවා ගැනීමෙන් පසුව අවම මිල ඉදිරිපත් කර ඇති E W Information System Limited ආයතනය තෝරා ඇති බව නිරීක්ෂණය කරමි.

යමුනා පෙරේරා
ලේකම්

කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය.